1172

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වසර අවසාන ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year EndEvaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

1. දෙවියන් වහන්සේගේ පණිවුඩය මනුෂ්‍යා වෙත හෙළිදරව් කරන තැනැත්තා හඳුන්වන්නේ;
   1. රබ්බි යනුවෙනි
   2. පූජකයා යනුවෙනි
   3. දිවැසිවරයා යනුවෙනි
   4. ගුරුවරයා යනුවෙනි

2. කිතු උපත සිදුවූයේ;
   1. බෙත්ලෙහෙම නම් පිලාත්ගේ නුවර
   2. බෙත්ලෙහෙම නම් දාවිත්ගේ නුවර
   3. බෙත්ලෙහෙම නම් හෙරොද්ගේ නුවර
   4. බෙත්ලෙහම නම් කයාපස්ගේ නුවර

3. පලස්තීනය යටත් විජිතව සිටි අධිරාජ්‍යය වන්නේ;
   1. බබිලෝනියානු අධිරාජ්‍යයට
   2. මිසර අධිරාජ්‍යයට
   3. මෙසපොතේමියානු අධිරාජ්‍යයට
   4. රෝම අධිරාජ්‍යයට

4. "එතුමා කල කිරෙන්නේවත් අධෛර්ය වන්නේවත් නැත" මෙසේ කීවේ කවුරුන් විසින් කා පිළිබඳව ද ?
   1. යෙසායා දිවැසිවරයා ජේසුස් වහන්සේ පිළිබඳව.
   2. යෙසායා දිවැසිවරයා ස්නාවක ජොහාන් පිළිබඳව.
   3. එලියා දිවැසිවරයා ජේසුස් වහන්සේ පිළිබඳව.
   4. එලියා දිවැසිවරයා ස්නාවක ජොහාන් පිළිබඳව.

5. "බොහෝ දෙනා ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වන්නාහ" යනුවෙන් හැඳින්වූයේ කවුරුන් පිළිබඳවද;
   1. ස්නාවක ජොහාන් පිළිබඳව
   2. ජේසුස් වහන්සේ පිළිබඳව
   3. සාමුවෙල් පිළිබඳව
   4. දාවිත් පිළිබඳව

6. මරියතුමිය දේව කැමැත්තට හිස නැමූ බව අඟවන වදන් පෙල වන්නේ;
   1. බලන්න මට හිමිවිය යුතු තැන ලැබී ඇත.
   2. ස්වාමින්වහන්සේ මා උසස් කොට සැලකීම අගය කරමි.
   3. ස්වාමින්වහන්සේගේ කරුණාව අනිවාර්යෙන් මට හිමිවිය යුතුවේ.
   4. බලන්න මම ස්වාමින්වහන්සේගේ දාසිය.වෙමි.

7. පෙරමග දූතයා ලෙස හැඳින්වෙන්නේ;
   1. ජේසුස් වහන්සේ
   2. ස්නාවක ජොහාන්තුමා
   3. සෙකරියස්තුමා
   4. පාවුල්තුමා

8. කිතු උපත පිළිබඳ ප්‍රථම පණිවුඩය එඬේරුන්ට සැල කිරීමෙන් අපට උගත හැකි පාඩම වන්නේ;
   1. පීඩනයට සහ අසහනයට පත් ජනතාවට කිතු උපත සහනයක් වූ බවය.
   2. රජවරුන්ට කිතු උපත සහනයක් වූ බවය.
   3. දේශපාලන බලවේග වලට වඩා එඬේරු පිළිගත යුතු බවය.
   4. පීඩාවට පත් ජනතාවට දේශපාලන නායකයකු හිමි වූ බවය.

9. චර්මඡේදන පිලිවෙතට සහභාගි වීමෙන් ජුදෙව් ජනතාව බලාපොරොත්තු වූයේ;
   1. පොරොන්දුවක් ඉටු කිරීමය.   2. චාරිත්‍ර ඉටු කිරීමය.
   3. දෙවියන් වහන්සේට සන්තක වීමය.   4. දෙවියන් වහන්සේගෙන් තව තවත් දේ බලාපොරොත්තු වීමය.

10. ජුදෙව් පිරිමි දරුවන් කැප කිරීම පිණිස ජෙරුසලම් දේව මාලිගාවට රැගෙන ගියේ දරුවා ඉපදී,
   1. දින 40 ක් ගතවීමට පෙරය.   2. දින 40 ක් ගතවූ පසුය
   3. දින 60 ගතවූ පසුය.   4. දින 60 ක් ගතවීමට පෙරය.

11. ස්නාවක ජොහාන් විසින් ජනතාවට ලබාදුන් බෞතීස්මය;
   1. මනස්ථාපනයේ බෞතීස්මයයි.   2. කරුණාවේ බෞතීස්මයයි.
   3. ගින්නේ බෞතීස්මයයි.   4. පිළිගැනීමේ බෞතීස්මයයි.

12. ස්නාවක ජොහාන්තුමා පොදු ජනතාවට ලබාදුන් පණිවුඩය මගින් අවධාරණය කරනුයේ;
   1. පොදු ජනතාවට වැඩ කරමින් තමා රැකීමටය.
   2. එකිනෙකා රැකගැනීම හා පෝෂණය කිරීම වේ.
   3. එකිනෙකා රැකගැනීමට පෙර තමා රැකී සිටීමටය.
   4. එකිනෙකා පෝෂණය කිරීම මගින් ප්‍රසිද්ධ වීමටය.

13. බිලිඳු කල පටන් සෑම ජුදෙව්වෙක්ම රාත්‍රි නින්දට පෙර ඔප්පුකල යාච්ඤාව වූයේ;
   1. මා හට ආශිර්වාද කළ මැනව
   2. අද රාත්‍රියේ සුවදායි නින්දක් දුන මැනව
   3. පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාරදෙමි
   4. පියාණෙනි ඔබගේ හස්තයට මාගේ නිදහස භාරදෙමි

14. දේවදූතයන් හා පුනරුජ්ජීවනය පිළිබඳ විශ්වාස නොකල කණ්ඩායම ලෙස ජුදා සමාජයේ පිලිගැනුනේ;
   1. පරිසිවරු   2. සද්දුසිවරු   3. විනයධරයන්   4. හෙරොදිවරු

15. "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා" යනුවෙන් ජේසුස්වහන්සේ පැවසූ වදනින් ඉස්මතු වන්නේ;
   1. කාගේවත් කැමැත්ත විමසීම නිෂ්ඵල බවය   2. තමකම රැකගෙන ක්‍රියා කළ යුතු බවය
   3. තම දැනුම අනුව තීරණ ගැනීම නිශ්පල බවය   4. තමකම සම්පූර්ණයෙන් නසා දැමිය යුතු බවය

16. ජේසුස් වහන්සේ ජෙරුසලම් දේව මාලිගාව පවිත්‍ර කිරීම මගින් ගම්‍යවන කරුණක් වන්නේ;
   1. දේව මන්දිරය පිරිසිදුව හා පිලිවෙලට තබා ගැනීම යුතුකමක් බවය
   2. ජේසුස් වහන්සේට පමණක් දෙව් මැදුරේ අපිරිසිදුකම පෙනුන බවය
   3. දෙවියන් වහන්සේගේ ගෘහයට ආදරය කිරීමකි
   4. දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියාකරන ජනතාව අවදි කිරීමකි

ජේසුස් වහන්සේ පාවා දීමට කටයුතු කල ශ්‍රාවකයා වන්නේ;
   1. සීමොන් පේදුරු   2. ජුදස් ඉස්කාරියොත්   3. මතෙව්   4. ජොහාන්

18. "පිරික්සාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න" යයි ජේසුස් වහන්සේ කී වදනින් අප ලබන ආදර්ශය වන්නේ;
   1. පරීක්ෂාවන් ජය ගැනීමට විවිධ දේ කල හැකි බවය.
   2. තීරණාත්මක අවස්ථාවන්ට මුහුණ දීමේදී යාච්ඤාවෙන් ක්‍රියා කළ යුතු බවය.
   3. පරීක්ෂාවන් ජය ගැනීමට අන් අය සතුටු වන දේ ක්‍රියාත්මක කල යුතු බවය
   4. තීරණාත්මක අවස්ථාවන්ට මුහුණ දීමේදී නැගී සිටීමට උත්සහ දැරිය යුතු බවය

19. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය දැරුවේ;
   1. හෙරොද්   2. නීරෝ අධිරාජ්‍යයාය   3. පිලාත්   4. උත්තම පූජකයා

20. "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය" යනුවෙන් පේදුරු කළ මහා ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ;
   1. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ බලාපොරොත්තුව ජේසුස් වහන්සේ තුළින් ඉටු වූ බවය
   2. පේදුරුතුමා නොබියව කථා කල බවය
   3. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ බලාපොරොත්තුව ගැන පේදුරුතුමා දැන සිටි බවය
   4. ශ්‍රාවකයන් ඉදිරියේ කැපී පෙනීමට පේදුරුතුමා උත්සාහ කල බවය

21. ස්නාවක ජොහාන්තුමා පවසන පරිදි ජේසුස් වහන්සේගේ බෞතිස්මය;
   1. ශුද්ධාත්මයෙන් හා ජලයෙනි
   2. ශුද්ධාත්මයෙන් හා ගින්නෙනි
   3. ජලයෙන් හා ගින්නෙනි
   4. ජලයෙන් හා ලුණු වලිනි

22. ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය මුලින්ම අත්දුටුවේ;
   1. කාන්තාවන් 2. පේදුරු 3. ක්ලේයෝපස් 4. තෝමස්

23. 'ජේසුස් වහන්ස ඔබ රාජශ්‍රියෙන් වඩිනා කල මා සිහිකල මැනව' යනුවෙන් ඉල්ලීම් කළේ;
   1. මුර සෙබෙලෙක්
   2. රෝම ශතාධිපතියෙක්
   3. කුරුසිපත් කල එක් වරදකරුවෙක්
   4. හඬමින් සිටි කාන්තාවක්

24. 'ස්වාමිනි ඔබ හා සමග හිරේ යාමට හා මරණයට වුවද මම සූදානම් බව පැවසුවේ;
   1. තෝමස් 2. පාවුල් 3. පේදුරු 4. ජොහාන්

25. අන්වෙසක්වීම හෙවත් රූප විපර්යාසය සිද්ධියේ දේව අභිමුඛය සංකේතවත් වූයේ;
   1. තාරකාව මගිනි
   2. වලා පටලය මගිනි
   3. ගින්න මගිනි
   4. ගිනි වැඹ මගිනි

26. දේව රාජ්‍යයේ ආධිපත්‍ය හිමිවන්නේ;
   1. දෙවියන් වහන්සේට ය 2. මිනිසාට ය 3. හෙරෝද් රජුට ය 4. පාරාවෝ රජුට ය

27. ප්‍රාතිහාර්ය අත්දැකීම පිණිස වඩාත් අවශ්‍ය වන්නේ;
   1. පිරිසිදුව සිටීමයි
   2. ප්‍රාතිහාර්ය සිදුවන ආකාර පිළිබඳ මෙනෙහි කිරීමයි
   3. ප්‍රාතිහාර්ය පිළිබඳ අධ්‍යයනය කිරීමයි
   4. ඇදහිල්ලෙන් සවිමත් වීමයි

28. "මුළු ඉශ්රායෙල් ජනතාව අතරේවත් මෙතෙරම් ශ්‍රද්ධාවක් මා දැක නැතැයි" යනුවෙන් පැවසුයේ;
   1. අංශභාග රෝගියාට සුවය ලබා දිමේදි
   2. ශතාධිපතියාගේ සේවකයාට සුවය ලබා දීමේදි
   3. ලාදුරු රෝගින්ට සුවය ලබා දීමේදි
   4. ගොලු බිහිරි මිනිසකු සුව කිරීමේදි

29. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අතර ප්‍රබලම මාධ්‍ය වූයේ
   1. උපමා කථා කීම 2. කටකථා කීම 3. පුවත්පත් සැකසීම 4. ගායනයට යොමු කිරීම

30. පාපයේ මාර්ගයෙන් හැරී නැවත උන්වහන්සේ වෙත අප එනතුරු දෙවියන් වහන්සේ බලා සිටින බව අඟවන කථාව නම්;
   1. මුතු ඇටය පිළිබඳ උපමාව
   2. දැල පිළිබඳ උපමාව
   3. නැතිවූ පුත්‍රයාගේ කථාව
   4. යහපත් සමාරිතයාගේ කථාව

31. දේව රාජ්‍යයේ පුරවැසියන් වන ඔබගේ හැකියාවන් උපරිම ලෙස කැපකල යුතු බව ඇඟවීමට ජේසුස් වහන්සේ වදාල උපමාව වන්නේ;
   1. යහපත් සමාරිතයාගේ උපමාව
   2. රන් කාසි දසය පිළිබඳ උපමාව
   3. නිධානය පිළිබඳ උපමාව
   4. අබ ඇටය පිළිබඳ උපමාව

32. වංචනික ගබඩාකාරයා පිළිබඳ උපමාව මගින් ඉස්මතු වන පාඩම වන්නේ;
1. ගබඩාකරුවකු වීම වගකීමක් සහිත රැකියාවක් බවය
2. රැකියාවට හැමවිට මුල්තැන දිය යුතු බවය
3. නිරතුරු ගබඩාවේ තොරතුරු විමසා බැලිය යුතු බවය
4. නිරතුරු ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියාකල යුතු බවය

33. දේව රාජ්‍යයේ පුරවැසිභාවය පතන ඔබ;
1. කුරුසිය දරාගෙන දේව රාජ්‍ය කැඳවීමට නිසි ප්‍රතිචාර දැක්විය යුතු වේ
2. සැම ඉරිදාම පල්ලි යාමට උත්සහ දැරිය යුතු වේ
3. හොඳ ආගමික පදනමක් මත අධ්‍යාපනය හැදෑරිය යුතුවේ
4. කුරුසිය ලකුණ සැම විට සැම තැන ප්‍රදර්ශනය කල යුතු වේ

34. විනාශ නොවන ස්වර්ගික වස්තුව මත විශ්වාසය රැඳවීමටයොමු විය යුතු බව ඇඟවීමට ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම වන්නේ;
1. ඵල නැති අත්තික්කා ගස පිළිබඳ කථාව
2. ධනවතා හා ලාසරුස් පිළිබඳ කතාව
3. නායින් නුවර වැන්දඹුවට පිහිට වීම පිළිබඳ කථාව
4. පොහොසත් මෝඩයා පිළිබඳ කථාව

35. පව් කමාව පිණිස මනස්ථාපනය වී බෞතිස්මය ලබන්න යැයි ස්නාවක ජොහාන්ගේ ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ;
1. බෞතිස්මය ලැබීම් මගින් දේව රාජ්‍යයේ පුරවැසියකු විය හැකි බවය
2. දේව නමස්කාරයට සහභාගි වීමෙන් දේව රාජ්‍යයේ පුරවැසියකු විය හැකි බවය
3. පව් කමාවට එකිනෙකා යොමු කිරීමෙන් දේව රාජ්‍යයේ පුරවැසියකු විය හැකි බවය
4. මනස්ථාපනය වී කටයුතු කිරීම දේව රාජ්‍යයේ පුරවැසියකු සතු යුතුකම බවය

36. දුගී වැන්දඹුවගේ ක්‍රියාව පිළිබඳව ජේසුස් වහන්සේ අගය කළේ;
1. කාසි දෙකක් පිරිනැමූ නිසා ය
2. තමා සතු සියල්ල පුදකල නිසා ය
3. රෝම කාසි භාවිතා නොකල නිසා ය
4. තමා සතු දෙයින් අඩක්වත් පුදකල නිසා ය

37. ශ්‍රාවකයන් ජේසුස් වහන්සේගෙන් කළ ඉල්ලීමක් වූයේ;
1. ඔවුන්ට අවශ්‍ය බලය පවරන ලෙසය
2. ඔවුන්ගේ නාමය ස්වර්ග රාජ්‍යයේ ලියා තබන ලෙසය
3. ඔවුන්ගේ ජීවිත සඵලවත් කරන ලෙසය
4. ඔවුන්ගේ ශ්‍රද්ධාව වැඩිකරන ලෙසය

38. අපගේ ජීවිත ගමන නොසැලී ඉදිරියට යාමට හා එල්ලවන අභියෝග ජය ගැනීමට;
1. හොඳ අධ්‍යාපනයක් ලැබිය යුතු වේ
2. දේව වචනය මත ජීවිත ගොඩ නැගිය යුතු වේ
3. එකිනෙකා සමග හිත දිනාගෙන සිටිය හැකි කාරණා ඉටුකල යුතු වේ
4. රැකියාවෙන් ලැබෙන මුදලින් අනාගතය සැලසුම් කල යුතු වේ

39. අහෝ ධනවත් වන ඔබට වන විපතක මහත
1. ඔබේ සැපවත් ජීවිතය විඳ හමාරය
2. තවත් ධනය රැස්කර ගැනීමට නොසිතිය යුතුය
3. ඔබ සිනාසෙනු ඇත
4. ඔබ තෘප්තිමත් වනු ඇත

40. දේව රාජ්‍යයේ පුරවැසියන් ක්‍රිස්තුස් වහන්සේ නැවත වඩින මොහොත තෙක්;
1. දේව නමස්කාරයට උපකාර කල යුතු වේ
2. දේව ගෘහය සුදානම් කල යුතුවේ
3. නිරතුරු සූදානමින් සිටිය යුතු වේ
4. භාවනාවෙන් කල් ගෙවිය යුතු වේ

1164

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අවසාන වාර ඇගයීම
ஆண்டு இறுதிமதிப்பீடு - 2019
Year EndEvaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න අතරින් 4 ක් (හතරක්) තෝරා පිළිතුරු සපයන්න.

1. අනිවාර්ය ප්‍රශ්නය
   1. එම්මානුවෙල් යන නමේ අර්ථය ලියන්න
   2. ගාබ්‍රියෙල් දේවදූතයා සෙකරියස් වෙත ගෙනෙන ලද පණිවුඩයේ ඇතුළත් විශේෂ කරුණු 2 ක් ලියන්න
   3. මතෙව් සුභාරංචියට අනුව ජේසු බිලිඳු බැහැ දැකීමට පැමිණි පෙරදිග ශාස්ත්‍රවන්තයින් රැගෙන ආවේ මොනවාද ?
   4. සිනගෝගයේ පැවති ප්‍රධාන කාර්යභාරය ලියන්න
   5. "රන් අණ "ලියන්න
   6. මා අනුව එන්න යැයි ජේසුස් වහන්සේ කළ ආරාධනාවට නිසි ප්‍රතිචාර නොදැක්වූ අය දැක්වූ ප්‍රතිචාරයන් ලියන්න
   7. දේව රාජ්‍ය වර්ධනය පිළිබඳ ඉගැන්වූ උපමා අතරින් 2 ක් නම් කරන්න
   8. රූප විපර්යාසය හෙවත් අන්වෙසක් වීම මොහොතේ ගෝල පිරිසට අසන්නට ලැබුණ දේව හඬ ලියා දක්වන්න
   9 ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා අතරින් ආශ්චර්ය මගින් ජනතාව දිනා ගැනීමේ අභියෝගයට ලක්වූ පරීක්ෂාව ලියන්න
   10. කිතුනු දරුවකු ලෙස ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග 2 ක් ලියන්න

2. 1. ජේසුස් වහන්සේ රූප විපර්යාසය සිදුවූ මොහොතේ එතැන සිටි ගෝලයින් නම් කරන්න
   2. ජේසුස් වහන්සේ රූප විපර්යාසය වූ අවස්ථාවේ උන්වහන්සේ දෙපස සිටි අය හා ඔවුන් තුළින් සංකේතවත් වූයේ කුමක්දැයි නම් කරන්න
   3. 'යාච්ඤාව ජීවිතයට වැදගත් වේ' යන මාතෘකාව යටතේ සඟරාවකට ලිපියක් ලියන්න

3. 1. දේව රාජ්‍ය ලකුණු හා ප්‍රාතිහාර්ය කාණ්ඩ 4 නම් කරන්න
   2. ඔබ නම්කල කාණ්ඩයට අදාලව උදාහරණය බැගින් ලියන්න
   3. ඔබේ මිතුරකු හෝ මිතුරියක රෝගීව සිටින මොහොතේ ඔබ කරන යැදුමක් ලියන්න

4. 1. නැතිවූවන් සොයා යා යුතු බව ඇඟවීමට ජේසුස් වහන්සේ වදාල උපමා 2 ක් නම් කරන්න
   2. මහ මංගල භෝජනය පිළිබඳ උපමාවෙන් දේව රාජ්‍යය පිළිබඳ එළි දැක්වෙන ඉගැන්වීම් 3 ක් ලියන්න
   3. කිතුනු සභාව තුළ නැති වූවන් යනු කවුරුන්දැයි හඳුන්වා ඔවුන් වෙනුවෙන් කළ හැකි සේවය ලියන්න

5. 1. ජේසුස් වහන්සේ ලබාදුන් උපදෙස් අනුව දේව රාජ්‍ය පුරවැසියන් වන ඔබගේ නායකත්වය කෙසේ විය යුතුදැයි කරුණු 2 ක් ලියන්න
   2. නායකයා කෙසේ විය යුතුදැයි ජේසුස් වහන්සේ ආදර්ශයෙන් පෙන්වූ අවස්ථා 2 ක් ලියන්න
   3. දේව රාජ්‍ය පුරවැසියකු වන ඔබ තුළ තිබිය යුතු ලක්ෂණ 3 ක් පිළිබඳව ලියා දක්වන්න

6. 1. දේව රාජ්‍යයේ පුරවැසියන් සිය පෞද්ගලික අවශ්‍යතාවල ඇලී ගැලී ඒ පිළිබඳව කරදර වීම අනවශ්‍ය බව ඇඟවීමට ජේසුස්වහන්සේ ඉදිරිපත් කළ නිදර්ශන 2 ක් ලියන්න
   2. දේව රාජ්‍ය කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේදී එහි භාරදූරකම අවබෝධකර දීම පිණිස ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ නිදසුන් 2 ක් ලියන්න
   3. ඔබට ලැබෙන දේව කැඳවීම් 3 ක් නම්කොට ඊට ප්‍රතිචාර දක්වන ආකාරය ලියන්න

7. 1. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා
   2. ස්නාවක ජොහාන් තුමාගේ පණිවුඩය
   3. අප අදහන ජේසුස් වහන්සේ ජීවමානය
   4. ජේසුස් වහන්සේ පරිසිවරු සමග පැවති සංවාද